ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2023

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාචනය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මාගේ වාර්තාවේ මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය.

මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගණුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැළපීමක් අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට, අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 32 ඡේදය ප්‍රකාරව ප්‍රමිතයෙහි ඉඩ දී ඇති අවස්ථාවලදී හැර වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ශේෂ හිලව් කර මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් නොකළ යුතු නමුත්, මණ්ඩලයේ මුල්හල්කැලේ වතුයායේ පාරිතෝෂික ගිණුමේ රු.1,067,176 ක ආරම්භක හර ශේෂය හඳුනා නොගෙන මුළු ගෙවිය යුතු පාරිතෝෂික ශේෂයෙන් අඩු කර තිබීම නිසා මණ්ඩලයේ ගෙවිය යුතු පාරිතෝෂික ශේෂය එම වටිනාකමින් ඌනගණනය වී තිබුණි.	මුල්හල්කැලේ වතුයාය සම්බන්ධව පවතින ශේෂ පත්‍රයේ ගෙවියයුතු පාරිතෝෂික ශේෂය ලෙස හර අගයක් පෙන්නුම් කරන අතර මෙම ශේෂ සම්බන්ධව තොරතුරු ආයතනය සතුව නොමැත. එම නිසා එම ශේෂය 2024 වර්ෂයේදි ශේෂ පත්‍රය තුළ වෙනම පෙන්වීමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ශේෂ හඳුනාගෙන නිවැරදි කිරීම් කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 06 ඡේදය ප්‍රකාරව වත්කමක් හඳුනාගැනීමේදී එහි නිර්වචනයට අයත් නොවන විකිණීමට හා ජීව විද්‍යාත්මක වත්කම් සඳහා භාවිතයට යොදාගත් කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතියට අදාලව සමාලෝචිත වර්ෂය අවසාන වන විට දරා තිබුණු රු.9,922,016 ක අයභාර වියදමක් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.	මෙය 2025 වර්ෂයේදි නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් යන නිර්වචනයට ඇතුලත් නොවන වියදම් ප්‍රාග්ධනිත නොකළ යුතුය.

(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 15 ඡේදය ප්‍රකාරව ඉඩම් හෙක්ටයාර 18,716.16 ක වටිනාකම තක්සේරු කර දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	තක්සේරුව ලබාගැනිම සඳහා විශාල මුදලක් වැයවන බැවින් වර්තමානයේ ඉඩම් බදුදිමේදි වාර්ෂික බදු කුලිය සඳහා පමණක් තක්සේරුව ලබාගනු ලබයි.ඒ සඳහා යන වියදමද බදුකරුගෙන් අයකර ගැනිමට ආයතනය විසින් කටයුතු කරනු ඇත. තක්සේරු අගයන් ලබා ගත් පසු ගිණුම්වලට ඇතුළත් කිරිමට කටයුතු කරනු ඇත.	මණ්ඩලයේ පාලනය යටතේ පවතින ඉඩම් තක්සේරු කර දේපල, පිරියත හා උපකරණ යටතේ හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කර නැවත තක්සේරු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට තවදුරටත් භාවිතා කරමින් පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වටිනාකම රු.356,099,978 ක දේපල පිරියත හා උපකරණ පිරිවැය සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මෙම වත්කම්වල අවශේෂ හා ඵලදායී ජීව කාලය නැවත තක්සේරු ලබාගැනිම සඳහා කමිටුවක් පත්කර එම කමිටුව සඳහා තක්සේරු නිලධාරින් තෝරා පත් කර ගැනිම සඳහා ප්‍රසම්පාදන අංශය වෙත යොමු කර ඇත. මෙම කාර්යය සිදුකිරිම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍යවන අතර, එම ක්‍රියාවලිය සිදුවීමෙන් අනතුරුව අදාළ තක්සේරු අගයන් ගිණුම්වලට ගැනිමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කර නැවත තක්සේරු කළ යුතු වේ.
(ඉ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 57 වන ඡේදය ප්‍රකාරව සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය යොදා නොගෙන සේවකයකුගේ වර්ෂ අවසානයේ ලබන මූලික වැටුප පමණක් පදනම් කර ගෙන සේවා ප්‍රතිලාභ ගණනය කර තිබුණි.	ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් පාරිතෝෂික ගණනය කිරිම පෙර සිටම 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව සිදුකර ඇත. කම්කරු දෙපාර්තමේන්තුව විසින් පාරිතෝෂික හිඟ ගෙවීම් සම්බන්ධව කටයුතු සිදුකරනු ලබන්නේ මෙම පනතට අනුව බවද සඳහන් කරනු ඇත. 2024.06.10 දින පැවති විගණන කළමනාකරණ කමිටුවේදී පාරිතෝෂික පනතට අනුව කටයුතු කිරිම නිවැරදි බව සඳහන් කර ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ආයු ගණන ක්‍රමය සේවා ප්‍රතිලාභ ගණනය කිරීමට වඩා ඵලදායී ක්‍රමයක් වන බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 හි 07 ඡේදය ප්‍රකාරව ඉඩම් හෙක්ටයාර 123,856.11 ක් සාධාරණ අගයට තක්සේරු කර ආයෝජිත දේපල යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	ප්‍රාදේශිය වතු සමාගම් වෙත ලබාදී ඇති ඉඩම් සම්බන්ධ තොරතුරු 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුලින් හෙළිදරව් කර ඇත.අනෙක් පාර්ශවය සඳහා බදු දී ඇති මණ්ඩලය සතු ඉඩම්වල වටිනාකම මේ වනතෙක් තක්සේරු කර නොමැති අතර, එසේ තක්සේරු අගයන් ලබා ගත් පසු ගිණුම්වලට ඇතුලත් කිරිමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව බදු දී ඇති ඉඩම් ගොඩනැගිලි ආයෝජිත දේපල යටතේ ගිණුම්ගත කළ යුතුය.

(උ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 12 හා 30 ඡේද ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ වටිනාකමට මැනිය යුතු වුවද, රු.21,938,031 ක් වූ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ස්ථාවර අගයක් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි. තවද සමාලෝචිත වර්ෂයේදී රු.53,580,028 ක ජීව විද්‍යාත්මක වත්කම් විකුණා ආදායමට ගෙන තිබුණද අදාල පිරිවැය වත්කම් වලින් ඉවත් කර නොතිබුණි.	2022, 2023 හා 2024 වර්ෂයන්හි දැව තක්සේරු වාර්තා වන සම්පත් අංශය විසින් ලබාගෙන ඇති අතර, එම වන සම්පත් අංශය විසින් ලබාදුන් දැව අගයන් හා ගස් ප්‍රමාණයන් සම්බන්ධව අදාළ වතුයායන් වෙත දන්වා ඇත. මෙය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආයතනය තුළ ප්‍රායෝගික ප්‍රශ්න උද්ගත වී ඇත. එබැවින් ඉදිරියේදී නිවැරදි අගයන් පොත්වලට ගැනීමට කටයුතු කරනු ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු අතර විකිණීමේ පිරිවැය වත්කම් වලින් ඉවත් කළ යුතුය.
(ඌ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 30 හා 55 ඡේද ප්‍රකාරව 1996 වර්ෂයේ සිට පරිණත වෙනත් වගාවන් යටතේ දක්වා තිබුණු රු.8,281,946 ක් වූ ජීව විද්‍යාත්මක වත්කම් (Bearer Plants) ක්ෂය කිරීමක් සිදු කර නොතිබුණි.	වගාවන් 05 කට අදාල රු. 8,281,946 ක් වන ජීව විද්‍යාත්මක වත්කම්වල ශේෂය අදාල වතු අධිකාරීන්ගෙන් භෞතිකව පැවැත්ම තහවුරු කරවා ගෙන ඉදිරි කටයුතු කිරීම් හා ක්ෂය කිරීම් කිරීමට කටයුතු කරනු ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව වත්කම්වල පැවත්ම තහවුරු කර එම වත්කම් ක්ෂය කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම නොවන වත්කම් වශයෙන් පෙන්වා තිබූ රු.283,113 ක් වූ හන්තාන වතුයායේ ක්‍රීඩා පිටිය, ඩාලි පාරේ පිහිටි ගබඩා කාර්යාලය සහ පාරිභෝජ්‍ය අංශයට අයත් රු.288,205 ක්වූ ගොඩනැගිලි තක්සේරු කිරීමකින් තොරව මණ්ඩලය ආරම්භ කළ 1972 වර්ෂයේ සිටම මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.	ආයතනයේ දිගින් දිගටම පවතින කාරක ප්‍රාග්ධන දුෂ්කරතා හේතුවෙන් 2002 වර්ෂයේ සිට 2023 ජූනි 30 වන දින දක්වා ව්‍යවස්ථාපිත ගෙවීම් පවා සිදුකර නොමැති තත්වයක ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන කිරීමට ආයතනය සතුව ප්‍රමාණවත් මුදල් නොමැත. එබැවින් මෙම ස්ථාවර වත්කම්වල පැරණි අගයන් එලෙසම පොත්වල පවතින අතර ඉදිරියේදී මෙම ගොඩනැගිලි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුලට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. හන්තාන ක්‍රීඩා පිටිය සම්බන්ධ මෙම අගය 2000 වර්ෂයට පෙර සිටම ගිණුම්වල පවතින අගයක් වන අතර එම වටිනාකම වාර්තා කිරීමට අදාල සාක්ෂි මෙතෙක් ලැබී නොමැත.	වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	මුරකරු වෙනුවෙන් ගෙවා තිබුණු රු.758,608 ක වැටුප අයහාර වියදම් ලෙස ගිණුම්ගත නොකර හන්තාන වතුයායේ තේ අලෙවිසැළේ පිරිවැයට ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වත්කම් අධිගණනය වී අලාභයද ඌනගණනය වී තිබුණි.	2025.10.28 දින නිවැරදි කර ඇත.	ගිණුම්කරණ මූලධර්ම අනුව වියදම් හා වත්කම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

(ඇ)	ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති ව්‍යාපෘති වෙනුවෙන් දරා තිබුණු රු.4,248,802 ක බිම් සකස් කිරීමේ පිරිවැය වගා වියදමක් ලෙස ලාභ අලාභ ගිණුමට හඳුනා නොගෙන කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබීම නිසා වත්කම් අධිගණනය වී අලාභය ද ඌනගණනය වී තිබුණි.	මෙම ව්‍යාපෘතින් තවමත් මුලික අදියරන් වල පවතින බැවින්, (බිම් සකස් කිරීම,වලවල් කැපීම) මෙම අගයන් ජීව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගෙන ජීව විද්‍යාත්මක වත්කම්වලට මාරු කිරිම සිදුකිරිම කල නොහැකි වනු ඇත.	ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති ව්‍යාපෘති වෙනුවෙන් දරා තිබුණු වියදම් වත්කම් ලෙස හඳුනා නොගත යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය තුළ රු.3,454,475 ක් වූ කෝවිල් සඳහා සිදු කරන ලද පරිත්‍යාග, කෙරීගෙන යන වැඩ ශේෂය තුළ ඇතුළත් කර තිබීම නිසා එම ප්‍රමාණයෙන් වත්කම් අධිගණනය වී අලාභය ද ඌනගණනය වී තිබුණි.	2024 වර්ෂයේදි මෙය නිවැරදි කර ඇත.	ගිණුම් මූලධර්ම අනුව වියදම් හා වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ දේපල පිරියත හා උපකරණ යටතේ තිබූ පිරිවැය රු.32,088,371 ක් වූ කාර්යාල උපකරණ,යන්ත්‍ර, පරිගණක උපකරණ අයිතමයන් 13 ක සමුච්චිත ක්ෂය වටිනාකම රු.24,340,038 ක් අයිතමයෙන් අයිතමයට හඳුනා නොගෙන සමස්ථ වටිනාකමක් ලෙස දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේ අයිතමයන්ගේ ශුද්ධ වත්කම් වටිනාකම පිළිබඳ නිවැරදි තහවුරුවක් නොතිබුණි.	2025 වර්ෂයේදි මෙම වත්කම් වෙන වෙනම හඳුනාගෙන අයිතමයන්ගේ ශුද්ධ වත්කම් වටිනාකම වෙන වෙනම පෙන්වීමට කටයුතු කරනු ඇත.	ශේෂ වටිනාකම් වල නිවැරදිතාව තහවුරු කර ගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන විගණනය වෙත ලබා දිය යුතු වේ.
(ඊ)	රහතුන්ගොඩ වතුයායේ Eco Tea Garden නැමැති සංචාරක නිකේතනයේ ඉදිකිරීමේ පිරිවැය රු.2,775,742 ක් වුවද, රු.3,644,726 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු.868,984 කින් වත්කම අධිගණනය වී තිබුණි.	2025 වර්ෂයේ ගිණුම් මගින් නිවැරදි කර ඇත.	පිරිවැය වැඩියෙන් දැක්වීමට හේතු සොයා බලා නිවැරදි කල යුතු වේ.
(උ)	මොන්තක්‍රිස්ටෝ වතුයාය 2003 වර්ෂයේ සිට විවිධ පාර්ශව වෙත බදු දී තිබූ අතර මෙම වතුයායේ දේපල පිරියත හා උපකරණ හා ජීව විද්‍යාත්මක වත්කම්වල පිරිවැය රු.32,168,955 ක වටිනාකමක් බදු දුන් දේපල යටතේ වසර ගණනාවක සිට ඉදිරියට ගෙන යන අතර ඊට අදාල වත්කම් වල පැවැත්ම තහවුරු කර ක්ෂය කිරීමක් මණ්ඩලය විසින්	මෙම මොන්තක්‍රිස්ටෝ වතුයායේ වත්කම්වලට අදාළව ලිපි ලේඛන නොමැති බැවින් මෙම වත්කම් ක්ෂය කිරිම සිදුකර නොමැති අතර, මෙතෙක් මෙහි පැවැත්ම පිළිබඳ තහවුරු කරගැනිමටද අපහසු වී ඇත.	වත්කම්වල පැවැත්ම තහවුරු කරගෙන ක්ෂය කිරීම් සිදු කළ යුතුය.

	සිදු කර නොතිබුණි.		
(ඌ)	නාගස්තැන්න වතුයායේ ප්ලාන්ටර්ස් බංගලාව (Planters Bungalow) නැමැති ගොඩනැගිල්ල කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂය තුළ ජනිත වූ රු.668,328 ක ශුද්ධ අලාභය, ලාභ අලාභ ගිණුමට ගැලපීම් නොකර විවිධ ණයගැති ශේෂයන් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2024 මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කර ඇත.	ගිණුම්කරණ මූලධර්ම වලට අනුව හඳුනා ගන්නා අලාභ ලාභඅලාභ ගිණුමට ගිණුම්ගත කළ යුතුය.
(එ)	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර තිබුණු “වතු සංවර්ධන ව්‍යාපෘතිය” 2010 වර්ෂයේදී අවසන් කර තිබුණද එම ව්‍යාපෘතියට අදාලව සෙවිලි තහඩු මිලදී ගැනීම සඳහා මණ්ඩලය විසින් වැය කරන ලද රු.4,136,733 ක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙනත් ලැබිය යුතු ශේෂයක් ලෙස වර්ෂ 13 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. මෙම ශේෂය ප්‍රතිපූරණය විය යුතු ආයතනය හඳුනාගෙන නොතිබුණු අතර අයවීම අවිනිශ්චිතාවය පිළිබඳව කිසිදු ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘති 2010 දී අවසන් වී ඇති අතර, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුග්‍රහය මත තිබූ මෙම ව්‍යාපෘතිය සිදුකළ ආයතනය මඟින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට මෙම ශේෂය අයවිය යුතු වුවත්, එම ආයතනයද දැනට ක්‍රියාත්මක නොවන ආයතනයක් වන බැවින් මේ සම්බන්ධව තව දුරටත් කරුණු සොයා බැලීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදුකරනු ඇත.මීට අමතරව ආයතනය සඳහා බොල් ණය හා අඩමාණ ණය ප්‍රතිපත්තියක් සකස් කිරිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනිමට කටයුතු කරනු ඇත.	ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර අයවීම අවිනිශ්චිතාවය පිළිබඳව අඩමාණ ණය ප්‍රතිපාදනයන් සිදු කළ යුතුය.
(ඒ)	හන්තාන වතුයායට අයත් අක්කර 01 පර්චස් 1.3ක පිහිටි තේ කර්මාන්තශාලාව හා ඉඩම 2001 ජනවාරි මස 01 දින සිට වර්ෂ 30 ක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට බදු දී තිබුණි. ආරම්භයේ සිට මේ දක්වා වසර 22ක කාලය තුළදී අයවිය යුතු රු.42,900,000 ක බදුකුලිය අය වී නොතිබූ අතර එම ලැබිය යුතු බදු කුලිය ගිණුම්ගත කර නොතිබුණි. එමෙන්ම මණ්ඩලය විසින් 2003 හා 2020 වර්ෂයන් හීදී තේ මණ්ඩලයෙන් ලබාගත් රු.34,000,000 ක ණය මුදල පියවීමට මණ්ඩලයට හැකියාවක් නොමැති නිසා එම කර්මාන්තශාලාව සහ ඉඩම තේ මණ්ඩලයට පවරාදීමට මණ්ඩලයේ 2020 පෙබරවාරි 27 දින පැවති අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත හන්තාන තේ කර්මාන්තශාලාව කෞතුකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බදු පදනම මත ලබා දීමට 2001 මැයි මස 21 වන දින ගිවිසුම්ගත වී ඇති අතර, බදු කාලය 2001 ජනවාරි 1 වන දින සිට 2030 දෙසැම්බර් 31 වන දින දක්වා ක්‍රියාත්මකය. මුල් කාලයේ මුදල් පදනම මත ගිණුම් සැකසීම මත මෙම ගිවිසුමට අදාලව ණයගැති ශේෂ සකස් කර නොමැත. වාර්ෂික බදු කුලිය 150,000 ක් වන අතර ඒ අනුව තේ මණ්ඩලය විසින් 2001 සිට අවුරුදු 03 බදු මුදල් ගෙවීම් කල අතර, පසුව ජනවසම විසින් 2003 වසරේ තේ මණ්ඩලය වෙතින් රු. මිලියන 25 ක් හා 2020 වර්ෂයේ රු.මි.10 ක ණය මුදලක් ලබාගෙන ඉන් රු.මිලියන 01ක් 2021 වර්ෂයේ ගෙවා ඇත. අනතුරුව තේ මණ්ඩලය විසින් බදු මුදල් ගෙවීම නතර කර ඇති අතර, එම මුදල මත මෙම තේ	ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු බදු මුදල් නිරවුල් කර ගැනීමට හා තේ මණ්ඩලයට ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

	මණ්ඩල රැස්වීම් තීරණය අනුව එකඟ වී තිබුණද, දේපල පැවරීමේ කටයුතු හෝ හිඟ බදු මුදල් හෝ අයවී නොතිබුණි. 2025 ජුලි 04 දින කර්මාන්තශාලවේ සිදුකල භෞතික පරික්ෂාවේදී පුද්ගලික ආයතනයක් විසින් එම කර්මාන්තශාලාව තේ කෞතුකාගාරයක් වශයෙන් පවත්වාගෙන යන අතර මණ්ඩලයට හෝ තේ මණ්ඩලයට හෝ කිසිඳු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.	කර්මාන්තශාලාව තේ මණ්ඩලය වෙත පවරා ගැනීමට ඉල්ලුම් කර ඇත.2024 ගිණුම් මගින් මෙය නිවැරදි කිරීමට පියවර ගනු ඇත.	
(ඔ)	සමාලෝචිත වර්ෂය අවසන් දිනට වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ තුළ ඇතුළත් රු.1,863,756 ක පැරණි අවිනිශ්චිත ගිණුම් ශේෂයට අදාල ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රධාන කාර්යාලයේ අවිනිශ්චිත ගිණුමේ රු.1,863,756 ක ශේෂය 1996 වර්ෂයට පෙර සිට පැවැත එන ශේෂයන් වන අතර, මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනිමට නොහැක. මේ සම්බන්ධව තොරතුරු සොයා ගැනීමට ආයතනය තුළ නොමැති නිසා පොත්වලින් කපා හැරිම සිදුකල නොහැකි වී ඇත.	අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කර ගැනීමට අවශ්‍ය තොරතුරු නොමැති නම් ගිණුම් ශේෂය වෙනුවෙන් ලාභ අලාභ ගිණුමේ ප්‍රතිපාදනයක් කළ යුතු වේ.
(ඕ)	මණ්ඩලයේ ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධව Bearer Plants හි නොමේරූ රබර් වගාව සඳහා 2003-2014 කාලය තුළ වැයකර තිබුණු වටිනාකම රු.41,998,357 ක් අවුරුදු 7ක කාලසීමාවකින් පසුව පරිණත රබර් වගාවට මාරු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය වන විට වසර 10 කට අධික කාලයක් ගත වී තිබුණද පරිණත වගාවට මාරු කර ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රායෝගිකව ගස්වල ස්වාභාවය අනුව පරිණත වන ගස් ප්‍රමාණය අදාළ වතුයාය විසින් ප්‍රධාන කාර්යාලය වෙත දැනුම් දුන් පසු නොමේරූ වගාවෙන් එම අගය මේරූ වගාව වෙතට මාරු කරනු ලබයි. නමුත් මෙතෙක් මෙම නොමේරූ වගාව රු.41,998,357 ක් වූ 2003-2014 කාලය තුල ඇති වටිනාකම මාරු කිරීම සම්බන්ධව අදාළ වතුයාය විසින් ප්‍රධාන කාර්යාලය දැනුවත් කර නොමැත.	මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට පෙර ප්‍රාදේශීය කාර්යාල වල ගිණුම් හා ගැටලු පිළිබඳ සාකච්ඡා කර නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ක)	වතුයායන් 11 කට අදාල රු.2,761,476 ක් වූ තේ තොග සහ තේ පැළ තොගය භෞතිකව නොමැති වුවද තොගය තුළ ඇතුළත්ව තිබුණි.	මෙම රු.2,761,476 ක් වූ තේ තොග හා තේපැල තොග නොමැති බවට විගණන තහවුරුව ලැබිමෙන් අනතුරුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.	තොග සත්‍යාපන සිදු කිරීම මගින් තොග වල භෞතික පැවැත්ම තහවුරු කළ යුතු බව සහ ඒ අනුව අවශ්‍ය ගිණුම්ගත කිරීම් හා ගැලපීම් කළ යුතු බව.
(ග)	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙනත් ජීව විද්‍යාත්මක වත්කම් පිරිවැය රු.17,925,652 ක් ලෙස දැක්වූවද, සමාලෝචිත වර්ෂය	මෙම වටිනාකම් 2016 ට පෙර සිටම පැවත එන අතර පිරිවැය ඉක්මවා ක්ෂය වී ඇති වටිනාකම පිළිබඳ නැවත වතාවක් සොයා බලා තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු	වත්කම් පිරිවැය ඉක්මවා ක්ෂය කිරීම් නිවැරදි කිරීමට කටයුතු

	අවසානයේ සමුච්චිත ක්ෂය වටිනාකම රු.18,520,206 ක් වූයෙන් වත්කමේ ශුද්ධ පොත් අගය රු.594,554 ක සෘණ ශේෂයක්ව පැවතුණි.	කරනු ඇත.	කළ යුතුය.
(ච)	හලාවත වැවිලි සමාගම 2019 වර්ෂයේ සිට මණ්ඩලය සතු ගොඩනැගිල්ලක කාර්යාලයක් සහ අලෙවි සැලක් කිසිදු ගෙවීමකින් හා ගිවිසුමකින් තොරව පවත්වාගෙන ගොස් තිබුණු අතර, 2019 සිට 2023 වර්ෂය දක්වා රජයේ තක්සේරුව අනුව ගණනය කර තිබූ රු.11,098,220 ක බදු මුදලක් මණ්ඩලයට ලැබිය යුතු යැයි හඳුනාගෙන තිබුණද, එම මුදල ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2019 සිට 2023 වර්ෂය දක්වා හලාවත වැවිලි සමාගම බිම් මහලේ පවත්වා ගෙන ගිය කාර්යාල සහ අලෙවි සැල සම්බන්ධයෙන් මෙතෙක් ගිවිසුමකට එළඹ නොමැති බැවින් මීට පෙර ඉඩම් අංශයෙන් ලැබිය යුතු බදු කුලියක් පිළිබද ගිණුම් අංශය දැනුවත් කර නොමැති බැවින් ගිණුම් ගත කිරීමක් සිදුකර නොමැත. එසේ වුවත් එවැනි වටිනාකමක් පිළිබඳව ලිඛිතව ගිණුම් අංශය දැනුවත් කිරීමක් 2025.11.25 වන දින නියෝජ්‍ය සභාපති මගින් අදාළ ආයතනය වෙත දැනුම් දී ගිණුම් අංශය වෙත පිටපත් කර ඇති බැවින් ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත.	මණ්ඩලයේ දේපල භාවිතා කරන සියලු පාර්ශවයන් සමග බදු ගිවිසුම් ඇතිකර ගැනීම හා ඒ අනුව බදු මුදල් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ජ)	ලුල්කඳුර වතුයායේ සවිකිරීම සඳහා ඉන්ධන ටැංකියක් මිලදී ගැනීමට ගණුදෙණුකරු වෙත ගෙවා තිබූ රු.1,614,000 ක් වූ අත්තිකාරම් මණ්ඩලයේ කෙරීගෙන යන වැඩ ලෙස සටහන් කිරීම නිසා මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	භෞතිකව මෙම ඉන්ධන ටැංකිය ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත මෙතෙක් ලැබී නොතිබුණද ඒ සඳහා සම්පූර්ණ පිරිවැයෙන් කොටසක් 60% ගෙවීම සිදුකර ඇත. මෙම ඉන්ධන ටැංකිය දැනට භෞතිකව ලැබී නොමැති බැවින් කෙරීගෙන යන වැඩක් ලෙස සඳහන් කර ඇති අතර, එම ටැංකිය වැඩ නිමවී ලැබුණු පසු අදාළ වත්කම් ගිණුමට ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත. කෙසේ නමුත් මෙම මුදල් ලබාදීම වත්කමක් ඉදිකර ස්ථාපිත කර (සවිකර ගැනිම) සම්බන්ධයෙන් ලබාදී ඇති නිසා මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් අධිගණනය වීමක් සිදුවී නොමැත.	වත්කම් මිලදී ගැනීමක් ලෙස ප්‍රසම්පාදනයන් සිදු කර තිබූ අතර ලබා දී ඇති මුදල් අත්තිකාරම් වශයෙන් ගිණුම්ගත කළ යුතුය.
(ට)	ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධව Bearer Plants තුළ තිබූ රු.7,859,380 ක නොමේරූ වෙනත් වගාවන් භෞතිකව නොපැවතියද මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර තිබුණි.	භෞතිකව මෙම වගාවන් නොපවතින බව අදාළ වතුයායන් විසින් දැනුම් දී ඇති බැවින් මෙම වගාවන් පරිණත වගාවන්ට මාරුකිරීම සිදුකර නොමැත.	වාර්ෂික සමීක්ෂණ මගින් වාර්ෂිකව වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කරගෙන අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල සිදු කළ යුතුය.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් මණ්ඩලයට ලැබිය යුතු ණය හා පොලී ශේෂය	119,318,496	97,709,342	21,609,154	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් වතු සංවර්ධන මණ්ඩලය වෙත ලැබිය යුතු ණය ශේෂය 119,318,496 ක් විශ්ලේෂණය කර සාරාංශ කර වාර්තාවක් අප විසින් රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතද, රජයේ විගණනය වෙත හා අමාත්‍යාංශ විගණනය වෙත ලබාදී ඇති අතර, අප විසින් යවන ලද වාර්තාවට පිළිතුරු වශයෙන් ඔවුන්ගේ ගිණුම් වලට අනුව වතු සංවර්ධන මණ්ඩලයට අයත් ලෙජර් ගිණුම්වල පිටපත් පමණක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අප වෙත එවා ඇති අතර, ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් එම ගිණුම් සමග සත්තේක්ෂණය කිරීම අපහසු වී ඇත.	රාජ්‍ය වැවිලි සංස්ථාව සමග ශේෂ සැසඳීම් කර නිවැරදි ශේෂය හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රධාන කාර්යාල යේ වාහන ක්ෂය	39,364,442	39,270,957	93,484	2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කර ඇත.	ගිණුම් සැසඳීම් කර නිවැරදි ශේෂ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.4 මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අඛණ්ඩව අලාභ ලැබීම මත 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ශුද්ධ වත්කම් හා කාරක ප්‍රාග්ධනය පිළිවෙලින් රු.1,107,147,225 ක් හා රු.2,351,853,826 ක සෘණ අගයන්	මණ්ඩලය සතුව පවතින ඉඩම් ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් නිසි පරිදි ප්‍රත්‍යාගණනයක් සිදුකර එම අගයන් පොත් වලට නොගැනිම හේතුවෙන් සෘණ	මණ්ඩලය සතුව පවතින ඉඩම් හා ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් නිසි පරිදි ප්‍රත්‍යාගණනයක් සිදුකර එම අගයන් පොත්

ගෙන තිබූ අතර එදිනට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් රු.2,399,597,208 ක් වී තිබුණි.මෙම බැදීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයන්ද සිදුකර නොතිබුණු අතර මෙහි පියවිය යුතු බැංකු ණය ශේෂය රු.167,188,744 ක් වී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 25 ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවත්නා බව නිරීක්ෂණය විය.

එමෙන්ම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක 2.4 මගින් මණ්ඩලය ප්‍රතිසංවිධානය කළ යුතු බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණද 2025 නොවැම්බර් 07 දින දක්වා එබඳු ප්‍රතිසංවිධානයක් සිදු කර නොතිබුණි.

අගයක් ගෙන ඇති අතර නැවත වත්කම් තක්සේරුවක් සිදුකල හොත් එම අගය ධනාත්මක අගයන් වනු ඇත. නමුත් එම කටයුතු සිදුකර ගැනිමට නොහැකි වී ඇත්තේ ආයතනයේ දිගින් දිගටම පවත්නා කාරක ප්‍රාග්ධන ඌනතාවයයි. එම හේතුව නිසාවෙන්ම නිසා මෙහි සඳහන් ව්‍යවස්ථාපිත දීමනා ගෙවීමට පවා නොහැකි වී ඇති බවත් සඳහන් කරමු. එසේම වරින් වර වර්ෂයෙන් වර්ෂයට මහා භාණ්ඩාගාරයෙන් ලැබූ මුදලින් මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම් සිදුකර ඇති අතර, වර්තමානයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් 2023 වර්ෂයේ ඉදිරිපත් කල අමප:23/0767/616/017ට අනුව මසකට රුපියල් මිලියන 30 බැගින් මෙම හිග ව්‍යවස්ථාපිත දීමනා ගෙවීමට මුදල් ලබාදිම සිදුකෙරේ. එම මුදලින් හිඟ ව්‍යවස්ථාපිත දීමනා වර්තමානයේ ගෙවීම් සිදුකරනු ලැබේ. එසේ වුවත් වර්තමාන ව්‍යවස්ථාපිත දීමනා (EPF/ETF) 2023 ජුලි මස සිට ක්‍රමානුකූලව ආයතනයේ මුදලින් මේ දක්වාම හිගයක් ඇති නොවන ආකාරයෙන් ගෙවාගෙන යමින් පවතින බවද සඳහන් කරමු.

2024 මූල්‍ය ප්‍රකාශන සඳහා වු සටහන් අංක 2.4 මගින් දක්වා ඇති ප්‍රතිසංවිධාන කටයුතු එක් එක් දේශපාලන අධිකාරින්ගේ වෙනස් වීම සමග එක් එක් අදාළ ප්‍රතිසංස්කරණයන් සිදුකරන බව දැන්වුවද මේ දක්වා එවැන්නක් සිදු වී නොමැත.

වලට ගැනීමටත් ආයතනයේ දිගින් දිගටම පවත්නා කාරක ප්‍රාග්ධන ඌනතාවයයන් මගහරවා ගැනීමට උපාය මාර්ග සකස් කර ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව මණ්ඩලය ප්‍රතිසංවිධානයන් කල යුතුය.

1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයේ දේපල පිරියත හා උපකරණ ශේෂය තුළ ඇතුළත් ප්‍රධාන කාර්යාලයේ ඉඩම්, ගොඩනැගිලි සහ වතුයායන්ගේ ගොඩනැගිලි, ඕනුගල්ඔය වතුයායට අදාල ස්ථාවර වත්කම් ශේෂය සහ වෙනත් ශේෂයන්, ජල සම්පාදන ව්‍යාපෘතියෙහි ශේෂය සහ හරංගල සහ ටයිස්පේන් වතුයායේ දේපල පිරියත හා උපකරණ වටිනාකම	1,579,600,504	සැඳහුම් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ඉඩම්වල පිඹුරුපත්, තක්සේරු වාර්තා, ශක්‍යතා අධ්‍යයන වාර්තාව, වාර්ෂික භෞතික සත්‍යාපන වාර්තා.	ප්‍රධාන කාර්යාලයේ ඉඩම් හා ගොඩනැගිලි ලෙස සඳහන් කර ඇති ප්‍රධාන කාර්යාලයට අයත් ඉඩම් හා ගොඩනැගිලි රු. 1,543,300,120 හි ඇතුලත් රු.1,489,375,963 පිළිබඳ විස්තරාත්මක තොරතුරු 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමග ලබා දී ඇත.අනිකුත් දේපළ සහ ගොඩනැගිලි වලට අදාළ විස්තරාත්මක තොරතුරු සොයාගැනීමට නොහැකි වී ඇත.	ඉඩම්,ගොඩනැගිලි සහ අනෙකුත් දේපලවල අයිතිය හා පැවැත්ම තහවුරු කිරීම සඳහා 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කරන ලද සාක්ෂි ප්‍රමාණවත් නොවන අතර ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	පාරිභෝගික අංශයේ පැරණි ණයගැති ශේෂය, මොන්ත ක්‍රිස්ටෝ වතුයායේ වත්කම් හා වගකීම්වලට අදාල පාලන ගිණුමේ ශේෂය, ලැබිය යුතු රඳවාගත් බදු සහ එකතු කළ අගය මත බදු, වෙළඳ ලැබිය යුතු ශේෂය තුළ ඇතුළත් ගැලපුම් ශේෂය	91,839,885	ශේෂ සනාථන, ණයගැති කාල විශ්ලේෂණ, භෞතික සත්‍යාපන වාර්තා, විස්තරාත්මක උපලේඛන සහ මෙම මුදල් අයකර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග	මෙම අගයන් පෙර වර්ෂ වල සිට මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරියට ගෙනයමින් පවතින අතර ඒ ඒ කාලපරිච්ඡේද වලට අවශ්‍ය තොරතුරු සොයා බලා ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	භෞතික ශේෂ තහවුරු කර හිඟ ශේෂ අයකර ගැනීමට හා හඳුනාගත නොහැකි ශේෂ සඳහා ප්‍රතිපාදන සිදු කිරීම වැනි නිවැරදි ක්‍රම වේදයන් අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන වල විශ්වාසදායී බව වැඩි කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	පැවරුණු වෙනත් ජීව විද්‍යාත්මක වත්කම් ශේෂය	17,925,652	භෞතික සත්‍යාපන වාර්තා, ගස් සංගණන වාර්තා සහ වටිනාකම තක්සේරු කිරීමට අදාල වාර්තා	1996 පෙර සිට පැවත එන ශේෂයකි.	වත්කමේ පැවැත්ම නිවැරදිව හඳුනාගෙන ශේෂ තහවුරු කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවට හා පුද්ගලික ආයතනයට දීර්ඝ කාලයක සිට ගෙවීමට පවතින ශේෂය,මහවැලි නිවාස ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ශේෂය, කල්බදු වත්කමට එරෙහිව තැන්පතු (Deposit against Asset Lease), ගෙවිය යුතු බදු වගකීම්වලට (එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, ආර්ථික සේවා ගාස්තු, උපයන විට ගෙවන බදු) සහ ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා වේතන ශේෂය, ණය ශේෂය- මහජන බැංකුව, වෙනත් තැන්පතු, වෙනත් ණයහිමි ශේෂය	651,745,631	ශේෂ සනාථන ,කාල විශ්ලේෂණ, කළ වැඩ වාර්තා සහ සහතික කළ බිල්පත්, තැන්පතුවලට අදාල ලදු පත්, දේශීය ආදායම් දෙපාර්තමේන් තුවෙන් ලද සහන කාලසීමාවන් දැක්වෙන ලිපි, කාලීන ගෙවීම්වලට අදාල වවුචර්පත්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය,ණය ලබාගත් දින, ණය මුදල, වාරිකය සමඟ පොළීය සහ ණය ගෙවීම්	එම්.සී.එම්. මාර්කටින් නැමැති ආයතනයට ගෙවීමට ඇති රු.5,109,600 වටිනාකම 2017.01.01 දිනට පෙර සිට පැවත එන ශේෂයකි. 2006 වර්ෂයේදි පමණ ජනතේ අංශයේ නිෂ්පාදනයන් ප්‍රචාරනය සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා එම ආයතනය වෙත භාරදෙන ලදි. එම අවස්ථාවේදී ඔවුන් විසින් ආයතනය සමග ප්‍රචාරක කටයුතු පවත්වා ගැනිම සඳහා ගිවිසුම් ගත විය. අවදානම් කටයුතු වෙනුවෙන් ඔවුන් විසින් රු. ලක්ෂ 15 ක ඇප තැන්පතුවක් ලබා ගන්නා ලදි. කෙටි කාල සීමාවන් තුළ මෙම කටයුත්ත අසාර්ථක වීම හේතු කොට ගෙන අලෙවි ප්‍රවර්ධන කටයුතු වලින් එම ආයතනය ඉවත්වන ලදි. තවද රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවට එම මුදල් ගෙවීමට පැවතුන නමුත් ආයතනය සතුව මුදල් නොමැතිකමින් ගෙවීම් සිදුකර නොමැත. මහවැලි නිවාස ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ශේෂය, කල්බදු වත්කමට එරෙහිව තැන්පතු, මහජන බැංකුවට ගෙවීමට ඇති ණය සම්බන්ධ තොරතුරු ආයතනය සතුව නොපවතින අතර 2024 සිට අදාල බදු නිසි පරිදි ආයතනය විසින් ගෙවීම සිදුකර ඇත.	ණය ශේෂ අයකර ගැනීමේ හැකියාව පිළිබඳ තක්සේරුවක් සිදු කර අයකර ගත නොහැකි ශේෂ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සිදු කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	වෙනස් නොවන පැරණි පොදු සංචිත ශේෂය, වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය	317,167,096	ප්‍රදාන හිමි වූ වර්ෂය, ලබා දුන් අරමුණු හා භාවිතය සහ ලබාදුන් පාර්ශවය, කළ වැඩ වාර්තා,	වෙනස් නොවන පැරණි පොදු සංචිත ශේෂය 2016 සිට නොවෙනස්ව පවතින සංචිත ශේෂ වලින් සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හා තේ මණ්ඩලය මඟින් ජනතා වතු සංවර්ධන	සංචිත ශේෂයන්ට අදාල මූලාශ්‍ර ලේඛන හඳුනාගෙන ශේෂ තහවුරු කර නිරවුල් කිරීමටත් ලබා දුන් ආධාර අරමුණු සඳහා යොදා ගැනීමටත් කටයුතු කළ යුතුය. .

සහතික කළ බිල්පත්, අරමුදල් ලද මූලාශ්‍රය සහ එය ගිණුම් ගත කිරීමට අදාල ප්‍රතිපත්තිය සහ ලද අනුමැතීන්	මණ්ඩලය වෙත නව පැල සිටවීම සඳහා ලබාදෙන ලද ආධාර මුදල් මගින් සකස් වී ඇති අතර වැව්ලි සංවර්ධන ව්‍යාපෘතියට අදාල ශේෂය සම්බන්ධ තොරතුරු ආයතනය සතුව නොමැත.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලයේ වතුයායන්ට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ රු.100,218,824 ක වෙළඳ වෙනත් ණයගැති කාල විශ්ලේෂණ වාර්තාව අනුව වසර 4-5ත් අතර සහ වසර 5ට වැඩි ණයගැති ශේෂය පිළිවෙලින් රු.3,219,427 ක් සහ රු.70,676,824 ක්ද, ප්‍රධාන කාර්යාලයේ රු.407,460,537 ක් වූ වෙළඳ ලැබිය යුතු ශේෂයට අදාලව වසර 3-6 ත් අතර ලැබිය යුතු ශේෂය රු.68,809,030 ක් බවත් වසර 6 ඉක්මවූ ලැබිය යුතු ශේෂය රු.65,078,179 ක්ද, පාරිභෝගික අංශයේ අවුරුදු 5 ඉක්මවූ ණය ප්‍රමාණය රු.16,590,553 ක් බවත්, මණ්ඩලය විසින් මෙම ශේෂ අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	වතුයායන්ට අදාල වසර 05 කට වැඩි ණයගැති ශේෂය රු.70,676,824 ක ශේෂය තහවුරුව සඳහා අදාල වතුයායෙන්ද ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරන අතර ප්‍රධාන කාර්යාලයේ හිඟ ශේෂ ඉන්වොයිස් නිකුත් නොකිරීම අංශ අතර ශේෂ සැසඳීම් නොකිරීම සහ බඳු ගිවිසුම් වල පිටපත් ලබා නොදීම වැනි හේතූන් නිසා නිවැරදි නොවිය හැකි වන අතර එම ශේෂ දැනට නිවැරදි කරමින් පවතිනු ඇත. තවද පාරිභෝගික අංශයේ අවුරුදු 05ට වැඩි ණයගැති ශේෂය තුළ රු.9,945,368 ශේෂයක් පවතින අතර මෙම මුදල් ලබාගැනිම සම්බන්ධව අවිනිශ්චිතතාවයක් ඇත. 2018 වර්ෂයට අදාළ රු.6,645,190 ක මුදල තුල ඇති රු.5,904,575 ක මුදල ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් නොලැබෙන බව සහතික කර ඇති බැවින් 2024.12.31 දින එම අගය පොත්වලින් ඉවත් කර ඇත.	ප්‍රධාන කාර්යාලයේ හා වතුයායන්වල වසර ගණනාවක සිට පවතින හිඟ ශේෂ අයවිය යුතු ආයතන හඳුනාගෙන අයකර ගැනීමට හා අවිනිශ්චිත ශේෂ සම්බන්ධයෙන් ප්‍රතිපාදනයන් සිදු කිරීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලයේ වතුයායන්ට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට රු.134,281,448 ක් වූ ණයහිමි කාල විශ්ලේෂණයට අනුව, වසර 04-05 ත් අතර රු.12,798,280 ක් සහ වසර 05 ඉක්මවූ රු.83,011,323 ක්ද, ප්‍රධාන කාර්යාලයේ රු.107,089,546 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුළ වසර 01-03ත් අතර රු.18,545,658 ක්ද, වසර 06 ඉක්මවූ රු.81,531,648 ක ණයහිමි ශේෂය තුළ රු.16,556,476 ක් වැවිලි මානව සංවර්ධන භාරයට අදාල ශේෂය සහ රු.57,307,354 ක් වූ වරිපනම් ගාස්තු යන ශේෂයන් ප්‍රධාන වශයෙන් පවතින අතර නිරවුල් කිරීම සඳහා මණ්ඩලය කටයුතු කර නොතිබුණි.	වතුයායන්හි ණයහිමි ශේෂය තුළ ඇතුලත් වසර 4 – 5 කාලයට අයත් රු. 12,798,280 ක හා වසර 05 ඉක්මවූ රු. 80,011,323 ක ණයහිමි ශේෂ සත්‍ය වශයෙන්ම පවතිද යන්න සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම සිදුකිරීම හා ආයතනයේ මූල්‍ය තත්වය අනුව ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත.	ණයහිමි ශේෂ තහවුරු කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සහ වතුයායන් සතුව පවතින දේපල පිරියත හා උපකරණ ශේෂය සම්බන්ධයෙන් වත්කමේ වර්ගය,මිලදී ගත් වටිනාකම, දිනය, වාහන අපහරණය කිරීම්, වාර්ෂිකව සිදු කළ මිලදී ගැනීම්,ඉවත් කිරීම්,මාරුකිරීම් සහ එක් එක් වත්කම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට හැකි වන පරිදි අදාල තොරතුරු ඇතුළත් කර විධිමත්ව සකස් කළ ස්ථාවර වත්කම් ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ගිණුම් අවශ්‍යතාවයන් සඳහා ආයතන විසින් වතු සඳහා හා ප්‍රධාන කාර්යාලය සඳහා වෙන වෙනම ස්ථාවර වත්කම් සම්බන්ධ විස්තර පිළිවෙලින් 1996 වර්ෂය හා 2008 වර්ෂයන් සිට ලේඛනයක් පවත්වාගන යන අතර, විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම සිදුකර නොමැත. ඉදිරියේදි නිවැරදි ආකාරයට ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව අදාළ තොරතුරු ඇතුළත් කරමින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය.

(ආ)	1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 16 (1) වන උප වගන්තිය	2011 වර්ෂයේ සිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු. 61,873,517 ක දායක මුදල් ගෙවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව භාරකාර අරමුදලට රු.6,871,791 ක ගෙවිය යුතු අධිභාර ශේෂයක්ද විය.	ආයතනයේ පැවති දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිඟය නිසා 2002 වර්ෂයේ පමණ සිට EPF/ETF දිගින් දිගටම ගෙවීමට නොහැකි වී තිබු අතර, මුදල් අමාත්‍යාංශයෙන් සමහර වර්ෂවල මෙම හිඟ ව්‍යවස්ථාපිත මුදල් ගෙවීම සඳහා අරමුදල් ලබාදී ඇත. ඒ අනුව එම මුදලින් ගෙවීම් සිදු කර ඇත. ඊට අමතරව 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 හා 25/1838/813/015 – 1ට අනුව රු. මිලියන 30ක මුදලක් සෑම මසකම, මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම් සඳහා ලබා දෙමින් පැවැති අතර එමගින් හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම් සිදුකරගෙන යන ලදී. තවද 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක පනතට අනුව හා 1980 අංක 46 දරන සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් පනතට අනුව 2023 ජූලි මස සිට වර්තමාන ව්‍යවස්ථාපිත ගෙවීම් ආයතනයේ මුදලින් ක්‍රමානුකූලව ගෙවා ගෙන යමින් පවතී.	පනත ප්‍රකාරව නියමිත දිනයට ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකළ යුතු අතර දීර්ඝකාලීනව ගෙවීමට තිබූ මුදල් පියවීමටත්, වාරික නිසි පරිදි ගෙවීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ ii වන කොටසේ 5 (1) උප වගන්තිය	සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයටරු.779,936,336 ක ගෙවිය යුතු පාරිතෝෂික ශේෂයක් සහ රු.261,651,215 ක ගෙවිය යුතු අධිභාර ශේෂයක් ද පැවතුණි.	දිගින් දිගටම ආයතනයේ පවතින කාරක ප්‍රාග්ධන මූල්‍ය දුෂ්කරතා නිසා ආයතනයේ සේවක පාරිතෝෂික මුදල් නිසි පරිදි ගෙවීම සිදු කිරිමට නොහැකි වී තිබු අතර, වර්තමානය වන විට නඩු දැමූ සේවකයන්ට 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 හා 25/1838/813/015 – 1ට අනුව මාසිකව ලද රු. මිලියන 30ක මුදලින් හා පවතින මුදල් ප්‍රවාහයෙන් සේවයෙන් ඉවත්ව ගිය හා යන සේවකයන් හට පාරිතෝෂික මුදල් ගෙවීම් සිදුකරනු ඇත	පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික නියමිත කාලයේදී ගෙවීමට කටයුතු කර අනාර්ථික වියදම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	1998 අංක 15 දරන සංශෝධිත සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වගන්තිය	ගෙවිය යුතු අර්ථසාධක ලෙස රු.1,035,396,366 ක්ද වතු කාර්ය මණ්ඩල අර්ථසාධක සංගමයට (ESPS) සහ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමයට (CPPS) රු.173,331,837ක හිඟ ශේෂයක්ද පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත අරමුදල් සඳහා රු.80,536,147 ක ගෙවිය යුතු අධිභාර ද ගෙවා නොතිබුණි.	ආයතනයේ පැවති දැඩි කාරක ප්‍රාග්ධන මූල්‍ය හිඟය නිසා 2002 වර්ෂයේ පමණ සිට EPF/ETF දිගින් දිගටම ගෙවීමට නොහැකි වී තිබූ අතර, මුදල් අමාත්‍යාංශයෙන් සමහර වර්ෂවල මෙම හිඟ ව්‍යවස්ථාපිත මුදල් ගෙවීම සඳහා අරමුදල් ලබාදී ඇත. ඒ අනුව එම මුදලින් ගෙවීම් සිදු කර ඇත. ඊට අමතරව 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 හා 25/1838/813/015 – 1ට අනුව රු. මිලියන 30ක මුදලක් සෑම මසකම, මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම් සඳහා ලබා දෙමින් පැවැති අතර එමඟින් හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම් සිදුකරගෙන යන ලදී. තවද 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක පනතට අනුව හා 1980 අංක 46 දරණ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් පනතට අනුව 2023 ජුලි මස සිට වර්තමාන ව්‍යවස්ථාපිත ගෙවීම් ආයතනයේ මුදලින් ක්‍රමානුකූලව ගෙවා ගෙන යමින් පවතී.	පනත ප්‍රකාරව නියමිත දිනයට ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකළ යුතු අතර දීර්ඝකාලීනව ගෙවීමට තිබූ මුදල් පියවීම සඳහාත්, වාරික නිසි පරිදි ගෙවීම තුළින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඉ)	2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 සහ 3.1 ඡේදය	රාජ්‍ය ව්‍යවසායක සභාපති, ප්‍රධාන විධායක නිලධාරි, කළමණාකාර අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රධාන මූල්‍ය නිලධාරි, ප්‍රධාන මෙහෙයුම් නිලධාරි සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර ඇති HM 1-1 ගණයේ හෝ ඊට ඉහළ මට්ටමේ තනතුරක් දරන ඕනෑම නිලධාරියෙකුට නිල වාහනයක් ලැබීමට සුදුසුකම් ලැබෙන බවත් නිල වාහන හිමි නිලධාරීන්ට අදාල ඉන්ධන දීමනා හිමි වුවද, චක්‍රලේඛයට පටහැනිව ඉන්ධන හා ප්‍රවාහන දීමනා	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ඉන්ධන හා ප්‍රවාහන දීමනා සම්බන්ධ චක්‍රලේඛ යටතේ MM 1-1 ශ්‍රේණියේ නිලධාරීන්ට ප්‍රවාහන දීමනාව හිමි නොවන බව දන්වා ඇත. එහෙත් පහත සඳහන් හේතූන් මත ජනතා වතු සංවර්ධන මණ්ඩලය පිහිට වූ 1972 අංක 11 දරණ කෘෂිකාර්මික පනතේ විධිවිධානයන් අනුකූලව මෙම ආයතනයේ එකී නිලධාරීන්ට සඳහා ප්‍රවාහන දීමනාව ලබාදීමට ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් කටයුතු කර ඇත. එහි පනතේ 5b,5c,8.8(1)b 8.1 උපවගන්ති	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව කටයුතු නොකළ යුතුය.

හිමිකම් නොමැති ස්ථිර නිලධාරීන් 09 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 03 දෙනෙකු සඳහා ප්‍රවාහන දීමනාව ලෙස රු. 4,590,000 ක ඉන්ධන දීමනාව ලෙස රු.3,702,980 ක මුදලක් ද 2023 වර්ෂය වෙනුවෙන් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

යටතේ එවැනි තීන්දු තීරණ ගැනිමේ හැකියාවක් මෙම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හිමි වී ඇත.

තවද මෙම කළමණාකරුවන් හා සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය අතර සාමාන්‍යාධිකාරී තනතුර හැර වෙනත් කිසිදු තනතුරක් ඇතුලත්ව නොතිබීම නිසා මෙම නිලධාරීන්ගේ තනතුරට අදාල රාජකාරීන්ගේ ස්වභාවය මත ඔවුන්ට පැවරී තිබූ රාජකාරීවලට අමතරව එකී තනතුරු සීමාවෙන් ඔබ්බට වූ ඉහල රාජකාරී කටයුතු ඉටු කිරිමට සිදු වී ඇත. එම නිසා මොවුන් HM 1 -1 ශ්‍රේණියේ ලා ගැනෙන රාජකාරීන්හි නිරත වේ.

ආයතනයේ අදාල රාජකාරීන් අඛණ්ඩව හා ප්‍රමාදයකින් තොරව සිදු කර ගැනීමටත් අනුමත සේවක සංඛ්‍යා සැලැස්ම තුල එවැනි ඉහල තනතුරු ඇතුලත්ව නොතිබීමත් හා එවැනි තනතුරු නිර්මාණය කර ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගත වීමත් නිසා මෙම නිලධාරීන්ට එකී ඉන්ධන ප්‍රවාහන දීමනාව ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු කර ඇත.

2020 වසරේදී මණ්ඩලය වැටුප් ගෙවීම කර ඇත්තේ මණ්ඩලයේ මුදල් පමණක් උපයෝගී කරගෙනය. භාණ්ඩාගාරයේ වැටුප් ගෙවීම සඳහා මුදල් ලබා ගෙන නොමැත.මෙයට අමතරව මෙම දීමනා ගෙවන නිලධාරීන් කිහිපදෙනෙකුගේම පත්වීම් ලිපිවල ඔවුන්ට මෙම දීමනා ලබා දීමට සේවා යෝජක බැඳී සිටින අතර පත්වීම් ලිපිය ප්‍රකාරව එම නිලධාරීන්ට ඇතිවන විෂමතා වැළැක්වීමට අනෙකුත් නිලධාරීන්ට මෙම දීමනා ලබා දී ඇත.

(ඊ)	2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 93 වන වගන්තිය	2022/2023 තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වාර්තාව 2025 නොවැම්බර් 07 දින තෙක්ම ඉදිරිපත් කර නොතිබුණි.	ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ආදායම් වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීම ප්‍රමාද වී ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අවශ්‍ය වීම මීට හේතු වී ඇත.	පනත ප්‍රකාරව තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වාර්තා ඉදිරිපත් කර බදු ගෙවීම සිදු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.147,859,712 ක පාඩුවක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ලාභය රු.20,000,509 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.167,860,221 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම ලාභයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් මණ්ඩලයේ තේ, රබර් සහ අනෙකුත් බෝග වගාවන්ට අදාල විකුණුම් ආදායම් රු.123,599,985 කින් අඩුවීමත් මෙහෙයුම් හා බෙදාහැරීමේ පිරිවැය සමස්ථයක් ලෙස රු.30,968,667 කින් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ තේ දළු විකිණීමෙන් ලද ආදායම 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සියයට 9.6 කින් අඩු වී තිබූ අතර, රබර් වගාවෙන් ලද ආදායම් 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සියයට 26 කින් අඩු වී තිබුණි. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ තේ දළු හා පාරිභෝජ්‍ය අංශයේ තේ නිෂ්පාදනයට අදාල පිරිවැය පිළිවෙලින් සියයට 0.3 කින් වැඩි වීමත් හා සියයට 11 කින් අඩු වීමත් සිදුවී තිබුණි.එමෙන්ම රබර් වගාවට අදාල පිරිවැය 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සියයට 2.7 කින් වැඩි වී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේ දී හා පෙර වර්ෂයේ දී ජංගම අනුපාතය 0.35:1 ක් හා 0.34:1 ක් විය.
- සමාලෝචිත වර්ෂයේ දී හා පෙර වර්ෂයේ දී ක්ෂණික වත්කම් අනුපාතය 0.31:1 ක් හා 0.30:1 ක් විය.
- සමාලෝචිත වර්ෂයේ දළ අලාභ අනුපාතය සියයට 3.29 ක් වූ අතර, පසුගිය වර්ෂයේ දි දළ ලාභ අනුපාතය සියයට 2.79 ක් විය.
- සමාලෝචිත වර්ෂයේ දී ශුද්ධ අලාභ අනුපාතය සියයට 11.6 ක් වූ අතර, පසුගිය වර්ෂයේ දී ශුද්ධ ලාභ අනුපාතය සියයට 1.43 ක් විය.

මණ්ඩලයේ 2022 හා 2023 වර්ෂයන්හි ඉහත සඳහන් අනුපාත පරීක්ෂාවේදී පවතින ජංගම වත්කම් වලින් එහි ජංගම වගකීම් පියවා ගැනීමේ හැකියාවක් නොමැති බවත් හා ආයතනයේ ස්කන්ධ ප්‍රාග්ධනය ඉක්මවූ ණය ප්‍රාග්ධනයක් පැවතීමත් තුළින් ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතාවය හා අඛණ්ඩ පැවැත්මේ අවදානම පිළිබඳ විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් තොරව ප්‍රධාන කාර්යාලයේ සහ වතුයායන් වල ගිණුම්මය ක්‍රියාකාරකම් 7 ක් ඉටුකර ගැනීමට අදාල මෘදුකාංග පද්ධතියක් සඳහා පෞද්ගලික සමාගමකට 2021 වර්ෂයේ සිට 2025 නොවැම්බර් 30 දක්වා මෘදුකාංග පිහිටුවීමේ සහ මාසික ගෙවීම් වෙනුවෙන් රු.16,562,250 ක් ගිවිසුම් ප්‍රකාරව ගෙවා තිබුණද,මෘදුකාංග පද්ධතිය මඟින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම,තොග පාලනය,ආදායම් හා වියදම් පාලනය යනාදි අරමුණු නිසි පරිදි ඉටු කර නොතිබුණි.	මේ සම්බන්ධව ගිණුම් අංශය විසින් පාලන අධිකාරිය නිරන්තරයෙන් දැනුවත් කිරීම සිදුකර ඇත.	ඉටු නොකරන ලද ගිණුම්මය ක්‍රියාකාරකම් පද්ධතියට ඇතුලත් කර ගැනීමට හෝ වැඩිපුර ගෙවූ මුදල් නැවත අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	2017 වර්ෂයේ වතුයායන් සඳහා Sage මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීම සඳහා එක් වතුයායක් වෙනුවෙන් රු.48,611 ක් බැගින් වතු 17ක් සඳහා රු.826,387 ක් වැයකර තිබුණු අතර ගිණුම්කරණ පද්ධතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම පිරිවැය අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි.	වතුයායන් මෙම Sage මෘදුකාංග දැනට භාවිතා කිරීම සිදුනොකරයි. ඒ වෙනුවෙන් දරා ඇති මෙම වියදම අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ගෙන වියදමක් ලෙස කපා හැරීමට කටයුතු කරනු ඇත.	සැලසුම් සකස් කර ඵලදායී කාර්යන්ට පමණක් මුදල් වියදම් කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නාගස්තැන්න සහ කන්දල්ඔය වතුයායන් වල පිළිවෙලින් රු.1,539,546 ක් හා රු.1,256,046 ක මුදල් සොරා ගැනීම් සිදු වී වසර 11 ක් පමණ ගතවී තිබුණද, පවරා තිබූ නඩු කටයුත්තෙහි වර්තමාන තත්ත්වය සොයා බලා නොතිබූ අතර වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	නඩු අංක HC 223/20 යටතේ නුවර මහාධිකාරණයේ මෙම නඩුව තවමත් විභාග වෙමින් පවති. 2025.12.11 දින නැවත කැඳවීමට කටයුතු කර ඇත. තවමත් නඩු කටයුතු පවතින බැවින් අලාභය අයකර ගැනිමට නොහැකිව ඇති අතර, ඉදිරි නීතිමය පියවර අනුව කටයුතු කරනු ඇත.	පවරා ඇති නඩු තීන්දු අනුව අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	2007 නොවැම්බර් සිට නාගස්තැන්න වතු යාය පෞද්ගලික සමාගමකට බදු දීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණද ගිවිසුම් ගත වී වසරක් ගතවීමට පෙර වතු යායේ ගස් 120ක් එම සමාගම විසින් අනවසරෙන් කපා ඉවත් කිරීම හේතුවෙන් එම වතුයාය නැවත මණ්ඩලයට පවරාගෙන තිබුණි. එම ගස්වල අලාභ අයකර ගැනීමට 2008 මැයි මාසයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නඩුවක් පවරා තිබුණි. එම අලාභය තක්සේරු කර අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණු අතර නඩු කටයුත්තද දෙපාර්ශවයේ එකඟතාවයෙන් කිසිදු වන්දියක් ලබා ගැනීමෙන් තොරව 2009 දෙසැම්බර් 28 දින අවසන් කර තිබුණි.	2007 වර්ෂයේදී නාගස්තැන්න වතුයායේ පාලනය ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ක්වින්රිච් ඇග්රෝ පුද්ගලික සමාගම සමඟ එක්ව පිහිටුවන ලද සිලෝන් යුනයිටඩ් ප්ලාන්ටේෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආරම්භ කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති අතර, ක්වින්රිච් ඇග්රෝ පුද්ගලික සමාගම විසින් රු.මිලියන 30 ක් ආයෝජනය කරන ලදී. එම මුදල ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ගෙවීම් කළ අතර, එමඟින් නාගස්තැන්න වතුයායේ හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් කරන ලදී. ඉන් අනතුරුව වතුයායේ පාලනය සිලෝන් යුනයිටඩ් ප්ලාන්ටේෂන් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම විසින් සිදු කළ අතර, එහිදී නාගස්තැන්න වතුයායේ පැවති වාණිජ වටිනාකමක් සහිත ගස් 120 ක් හෙලීම් කර තිබුණි. ඒ අනුව රු.11,200,000 ක මුදලක අලාභයක් වතුයායට සිදු වී ඇති බව එවකට වැවිලි කළමණාකරු විසින් ප්‍රකාශයක් ලබා දී තිබුණද ගස්වල වටිනාකම රු.7,529,688 ක වටිනාකමක් මත එම ගස් හෙලීමට එරෙහිව පනවා තිබූ අංක B 2683/08 දරණ නඩුව සමථ වී ඇත. එම වටිනාකම දිස්ත්‍රික් වන නිලධාරිතුමාගෙන් 2008.08.12 දින ලබාගෙන ඇති බව සඳහන් කර ඇතිමුත් එහි පිටපතක් අප සතුව නොමැත. එහි පිටපතක් ලබා ගැනීම සඳහා පියවර ගන්නා බව වැඩිදුරටත් දන්වනු ඇත.	මණ්ඩලයට සිදු වී තිබූ අලාභය බදුකරුගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත අනුව විකල්ප ඉඩම් ලබා දීම සඳහා ප්‍රතිපාදන නොමැති වුවත් 2019 ජූලි 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගත් තීරණයක් මත පදනම්ව පෙන්රින් වත්තේ අක්කර 22 රූඩ් 00 පර්චස් 30.08 ක ප්‍රමාණයට විකල්ප ඉඩම් වශයෙන් පුද්ගලයින් දෙදෙනෙකුට හන්තාන උඩුවෙල වතුයායේ ඉඩම් ලබා දී තිබුණි. එම අනුමැතිය මත පදනම්ව 2020 ජූලි 31 දින මෙම ඉඩමේ අයිතිය රු.101,109	පුද්ගලයින් දෙදෙනෙකු වෙත කොළඹ දිස්ත්‍රික්කයේ පෙන්රින් වතුයාය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ලබා දුන් අක්කර 22 පර්චස් 30.02 ක ඉඩම් ප්‍රමාණය නිදහස් කිරීමට පුස්සැල්ලාව වැවිලි සමාගම කටයුතු නොකිරීම මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඊට විකල්පයක් ලෙස උඩුවෙල වතුයායෙන් අක්කර 22 පර්චස් 30.08 ක් ලබාදෙන ලෙස ඉල්ලුම් කරන ලදී. ඒ අනුව එම ඉල්ලීම ජනතා වතු සංවර්ධන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලද අතර, අධ්‍යක්ෂ	කෘෂිකාර්මික සංවර්ධනය සඳහා මණ්ඩලයට පැවරී ඇති ඉඩම් වලින් විකල්ප ඉඩම් ලබා දීමට මණ්ඩලයේ අනුමැතිය ලබා දීම හා ඒ සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව විසින් ඔප්පු ලබාදීම පිළිබඳව විමර්ෂණය සිදු කළ යුතුය.

ක් වැනි අඩු වටිනාකමකට අදාල පුද්ගලයින් දෙදෙනා වෙත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පවරා තිබුණි. තවද විකුණුම් ගිවිසුම් අංක 5792 මගින් මෙම ඉඩමේ හිමිකරුවන් විසින් 2020 දෙසැම්බර් 11 වන දින අදාල ඉඩම දේපල විකුණුම් සමාගමකට (Land sale) රු.159,753,600 කට විකුණා තිබුණු අතර පසුව එය හෝටලයක් සඳහා පුද්ගලික සමාගමකට 2025 ජුලි 22 වන විටත් විකුණා තිබුණි.	මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව එම ඉල්ලීමට මෙම ඉඩම් කොටස ලබා දීම සඳහා අනුමැතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇත. මෙම ඉඩමේ වටිනාකම සම්බන්ධයෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලය කිසිදු තීරණයක් ගෙන නොමැති බවත් ඒ සඳහා මැදිහත් වීමක් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට කළ නොහැකි බවත් දන්වා සිටින අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් පුද්ගලයින් වෙත ලබා දී ඇති ඔප්පුව මත පසුව මෙම ඉඩම සඳහා විකුණුම්කර ලියා ඇති බවත් සඳහන් කරනු ඇත.	

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වොක්ෂෝල් වීදියේ පිහිටි මණ්ඩලය සතු ගබඩා 2ක් තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව 2005 වර්ෂයේදී වසර 30ක් සඳහා රු.105,000 ක මාසික බදු කුලියකට පෞද්ගලික සමාගමක් වෙත බදු දීමට ගිවිසුම් ගත වී තිබුණි. එම බදු ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව තක්සේරු වාර්තාව පදනම් කරගෙන මාසික බදුකුලිය ගෙවීමට එකඟ වී තිබුණි. මාසික තක්සේරු වටිනාකමේ වැඩිවීම රු.95,000 බැගින් මාසික වාරික 49 ක් වෙනුවෙන් රු.4,655,000 ක් හා රු.175,000 බැගින් මාසික වාරික 14 ක් වෙනුවෙන් රු.2,450,000 ක් බදු දුන් 2005 දෙසැම්බර් සිට 2011 පෙබරවාරි දක්වා බදු කුලියේ වැඩිවීම වූ එකතු වටිනාකම රු.7,105,000 ක මුදලක් අය කර නොතිබුණි. පළමු බදු ගිවිසුම අවසන් වීමට පෙර නැවත එම බදුකරු සමඟ 2011 මාර්තු මාසයේදී රු.105,000 ක මාසික බදු කුලී වටිනාකමක් ගෙවීමටත් තක්සේරු වාර්තා පදනම් කරගෙන මාසික බදු කුලිය ගෙවීම යන වගන්තිය ඉවත් කර වසර 30 කට බදු ගිවිසුමකට එළඹී තිබුණි.	වොක්ෂෝල් වීදිය පිහිටි ගබඩා දෙකක් නිලෝනා ලංකා පුද්ගලික සමාගම වෙත බදු පදනම මත ලබා දී තිබූ අතර, එම ගොඩනැඟිලි බදු පදනම මත ලබා දීම සඳහා තරඟකාරී මිල ගණන් කැඳවීම සම්බන්ධයෙන් තොරතුරු ලිපිගොනුව තුළ නොමැත. එම කාර්ය හා සම්බන්ධව කටයුතු කරන ලද සේවකයින්ද දැනට සේවයේ නොමැති හෙයින් ඒ පිළිබඳව සොයා බැලීමටද හැකියාවක් නොමැත. කෙසේ වෙතත් ඔබ විසින් පෙන්වා දී ඇති 2005 සිට 2011 දක්වා කාලය සඳහා හිඟ බදු මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ඇත. 2011 වසරේදී අත්සන් කරන ලද බදු ගිවිසුම අනුව තක්සේරුව මත බදු මුදල් සංශෝධනය කිරීමට නොහැකි වීම මත මෙම අලාභය මණ්ඩලයට සිදු වී ඇති බව පිළිගන්නා අතර, නව ගිවිසුමක් අත්සන් කිරීම සඳහා සාකච්ඡා කළද ඉලේපෙරුම පාර්ශවය සමඟ පැවති නඩුව සඳහා ලබා දී ඇති නඩු තීන්දුව සහ නාගරික සංවර්ධන	බදු ගිවිසුමක් ක්‍රියාත්මකව තිබියදී බදුකරුට වාසි වන ආකාරයට නව බදු ගිවිසුමක් ඇති කිරීමට යොමු වූ කරුණු සොයා බලා මණ්ඩලයට සිදු කර ඇති අලාභය, වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

දෙවන බදු ගිවිසුම අනුව තක්සේරු වාර්තාව පදනම්ව බදු අයකිරීම් කොන්දේසි ඉවත් කිරීම නිසා 2011 මාර්තු සිට මාසික තක්සේරු වටිනාකමේ වැඩිවීම රු.119,000 බැගින් මාසික වාරික 58 ක් වෙනුවෙන් රු.6,902,000 ක් සහ රු.353,000 බැගින් මාසික වාරික 36 ක් වෙනුවෙන් රු.12,708,000 ක් වශයෙන් හා රු.438,000 බැගින් මාසික වාරික 60 ක් වෙනුවෙන් රු.26,280,000 ක් වශයෙන් එකතුව රු.45,890,000 ක් 2011 මාර්තු සිට 2023 දෙසැම්බර් දක්වා තක්සේරු වාර්තාවට අනුව අයවිය යුතු බදු ආදායමක් මණ්ඩලයට අහිමි වී තිබුණි.

අධිකාරිය විසින් මෙම ඉඩම තුළ මහල් ගොඩනැගිලි තැනීමට අවසර නොදීම ඊට බාධාවක් වී ඇත.